
# හිත හොඳ පැංචී



කතෘ - ඉමන්දි නවංජනා

# හිත හොද පැංචි

## ඉමන්දි නවංජනා

### කතෘ

## කතෘගේ වෙනත් පොත්

### පළමු දිගහැරීම

පාසල **:-** මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර
ඉගෙනුම ලබන පන්තිය **:- 3 A**
කෘතිය පළ කරන දිනය **:- 2026.04.15**
**ISBN – 978-624-211-267-1**

# පිදුම

**මුල් අකුරු කියවූ විදුහල්පතිනිය ඇතුළු ගුරුවරුන්ටත්,**

**මා මෙන්ම අකුරු ගලපන සහෝදරියන්ටත්...**

**ආදරයෙන් පුදමි....!**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය



CS CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# හිත හොඳ පැංචි

එක්තරා ගමකට නුදුරින් ඉතාම ලස්සන පුංචි හා පවුලක් ජීවත් වුනා.

ඒ පවුලට හිටිය එකම හා පැංචි හරිම හුරතල්... ඒ වගේම හරිම දඟයි.

මේ හා පැංචි එයාගේ දෙමව්පියන්ට හොඳ කීකරු හා පැංචියක් වුනේ නැහැ.

ඒ නිසාම එයාට හැමෝම දඟ පැංචි කියන්න පටන් ගත්තා....




හා අම්මා මේ හා පැංචි දඟ නිසා හා පැංචිව ඇස් දෙකට පෙනෙන මානයේ තියාගන්න හැම වෙලාවෙම මහන්සි වුණා.

දවසක් හා අම්මා මේ හා පැංචිත් එක්ක කෑම ටිකක් සොයාගන්න කැලයට ගියා...

අම්මා පැංචිගේ දඟ වැඩ ගැන දන්න නිසාම ලගින්ම තියා ගත්තා...

අම්මයි පැංචියි දෙන්නා කැලේ ඇතුලටම ඇවිදගෙන ගියා....



කලින් දවසේ කැලයට වැස්ස වැහැලා හැමතැනම මඩ වලවල් පිරිලා තිබුනා.

හා අම්මා පැංචිව පරෙස්සමින් මඩ වලවල් වලින් බේරගෙන කැලේ ඇතුලට ඇතුලට ගියා...

අම්මා කොයි තරම් පරෙස්සම් කලත් පැංචි පුංචි ඉඩක් ලැබුන ගමන් අම්මගෙන් ඈතට දුවනවා....

මෙහෙම දුවනකොට පැංචි එකපාරටම මඩ වලකට වැටුනා..

හා අම්මා ගොඩක් බය වුනා.


අනේ මං කොහොමද මගේ පැංචිව බේර ගන්නේ..... හා අම්මා විලාප දෙන්න පටන් ගත්තා...

හා අම්මාගේ විලාපය කැලේ ඇතට ඇසුනා... ඒ විලාපය ඇසුනු කැලේ අනෙක් සතුන් හා අම්මා විලාප දෙන තැන සොයාගෙන ආවා....

ඒ යාළුවෝ එකතුවෙලා හා පැංචි බේරා ගත්තා... හා අම්මා පැමිනි යාළුවන්ට ස්තූති කලා...

යහළුවන් පිටත් වෙන්න කලින් පැංචිට කථා කලා.... කතා කරලා පැංචිගේ දඟ වැඩ නතර කරන්න උපදෙස් දුන්නා. බයවෙලා හිටිය පැංචි ඒ උපදෙස් හොදින් පිළිගත්තා...

එදා ඉදන් හා පැංචි එයාගේ දඟ වැඩ සියල්ල නතර කලා.. දෙමව්පියන්ට කීකරුවුනා... මොනදේ කලත් දෙමව්පියන්ගෙන් අහලා කරන්න පුරුදු වුනා....



ඒ වගේම එයා දැන් ගමේ හැමෝටම උදවු කරන්න පටන් ගත්තා.. හැමෝගේම හොඳ හිත දිනා ගත්තා..

පැංචි ඉස්සර වගේ දැන් දඟ වැඩ කරන්නේ නැහැ කියලා ගමේ හැමෝම කතා වුනා...

එයාගේ මේ වෙනස්වීම ගැන හැමෝම පැහැදුනා.. ඒ නිසා හැමෝම ඒයාට ආදරේ කරන්නත් පටන් ගත්තා...

එහෙම කාලයක් යනකොට මේ දඟ පැංචිට ගමේ හැමෝම හිත හොඳ පැංචි කියලා කථා කරන්න පටන් ගත්තා....



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල්  අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන්  වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි  මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN – 978-624-211-267-1**